සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
**Department of Divineguma Development**

4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல
4th floor, Sethsiripaya ,Battaramulla

මගේ අංකය / எனது இல / My No: DVN/HO/Acc/CA/ISO-01

ඔබේ අංකය / உமது இல / Your No: ..........................................

දිනය / திகதி / Date: 2016.03.

සියළුම දිස්ත්‍රික් දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියළුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන්

<u>දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරී සුභසාධන අරමුදල (Welfare fund) සඳහා දායක මුදල් අයකිරීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ අංක DVN/HO/Acc/CA/ISO-01 හා 2014.06.13 දිනැති ලිපිය හා බැදේ.

2016.03.08 දින සමාජ සවිබල ගැන්වීම් හා සුබ සාධන අමාත්‍ය ගරු එස්. බී. දිසානායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් එම අමාත්‍යාංශයේ දී සියළුම වෘත්තීය සමිතිවල අදහස් හා යෝජනා සාකච්ඡා කිරීමටත්, පසුගිය මාස කීපය තුලදී ගන්නා ලද තීරණ වල ප්‍රගතිය විමසා බැලීමටත් මෙම රැස්වීම පවත්වන ලද අතර,. මෙම රැස්වීමට වෘත්තීය සමිති නියෝජිතයින්, අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු අදාල නිලධාරීන් සහභාගිවන ලදී.

මෙම සාකච්ඡාවට පැමිණ සිටි සියළුම වෘත්තීය සමිතිවල නියෝජිතයන්ගේ ඉල්ලීමට අනුව ඉහතින් දක්වා ඇති "නිලධාරී සුභසාධන" අරමුදල පිළිබඳව පහත සඳහන් කර ඇති හේතු නිසා එම සුභසාධන අරමුදලට වැටුපෙන් අයකර ගන්නා මුදල් නැවත දැනුම්දෙන තුරු අත්හිටුවීමට තීරණය කරන ලදී.

1. මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය විසින් අවස්ථා ගණනාවකදී අභ්‍යන්තර විගණන පරීක්ෂණයක් සිදුකිරීමට කටයුතු කල ද ඒ සඳහා ඉඩ ලබානොදීම.
2. " සමාජ සුභසාධන" අරමුදල් නිසි පරිදි අදාල ප්‍රතිලාභීන්ට ලබා නොදීම පිළිබඳව පැමිණිලි ලැබීම.
3. විනිවිදභාවයකින් තොරව "සමාජ සුභ සාධන" අරමුදල් පාලනය කිරීම.
4. එක් වෘත්තීය සමිතියක් විසින් පමණක් මෙම අරමුදල් පාලනය කිරීම නිසා එම වෘත්තීය සමිතියට වාසිසහගත වන ලෙස කටයුතු කිරීම.

ඒ අනුව උක්ත සඳහන් 2014.06.13 දිනැති ලිපියෙහි අංක 02 ඡේදයෙන් දැනුම් දී ඇති පරිදි එක් සාමාජිකයෙකුගෙන් මාසිකව අයකරනු ලබන රු. 150/- ක දායක මුදල 2016 මාර්තු මස සිට අදාල නිලධාරියාගෙන් අයකිරීම නැවත දැනුම් දෙනතුරු තාවකාලිකව අත්හිටුවන ලෙස මෙයින් දැනුම් දෙමි.

චන්ද්‍රා වික්‍රමසිංහ
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :- 1. ලේකම්, සමාජ සවිබල ගැන්වීම් හා සුබ සාධන අමාත්‍යාංශය - කා.දැ.ස
2. ප්‍රධාන ගණකාධිකාරී, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ස සහ අ.කා.ස
3. ගරු අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම් - කා.දැ.ස
4. සියළුම වෘත්තීය සමිති ලේකම්වරුන් - කා.දැ.ස.